&× ´ {ÆæÈ à`ÑÍ ó
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය - I

කාලය පැය 1 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.

01 සිදුහත් කුමරුගේ ළමා අවධියේ දක්නට නොලැබුණු ලක්ෂණයක් වූයේ,

(1) කීකරු බව (2) කාරුණික බව

(3) වංක බව (4) මෙත් සිත්වලින් යුක්තවීම

02 ස්වයංවරයකින් සුදුසු කුලකුමරිය තෝරාගැනීමේ එදා පැවැති සිරිතට අනුව සිදුහත් කුමරා විවාහ වූයේ,

(1) භද්දකච්චානා සමගය (2) සුජාතා සමගය

(3) මාගන්දියා සමගය (4) ඛේමා සමගය

03 සිදුහත් කුමරුට ගිහිගෙය සැපවත් කාමභෝගී ජීවිතයකට සුදුසු ඒකායන මග බව පෙන්වීමට අවැසි පරිසරය පියරජතුමා විසින් ගොඩනගා තිබුණි. ඒ අනුව ඔහුට තනාදී තිබූ මාලිගා ගණන,

(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

04 මව අහිමි වූ බොහෝ දරුවන් ජීවිත අසාර්ථක කරගනිති. එහෙත් බෝසත් කුමරුට එය දිනාගත හැකි අභියෝගයක් විය. සිදුහත් කුමරුට මව අහිමි වූයේ,

(1) උපන් මොහොතේය (2) ඉපදී දින දෙකකිනි

(3) ඉපදී දින තුනකිනි (4) ඉපදී සත් දිනකිනි

05 මාලිගාවෙන් පිටත ලෝකයේ යථාර්ථය දැකීමට කුමරුට අවශ්‍ය විය. රජ උයනට යන කුමරුට අතරමගදී සතර පෙර නිමිති දක්නට ලැබුණි. ඉන් කුමරුගේ සිත සන්සුන් බවට පත්වූයේ,

(1) මහල්ලකු දැකීමෙනි. (2) ලෙඩෙකු දැකීමෙනි.

(3) පැවිදි රුව දැකීමෙනි. (4) මළ කඳක් දැකීමෙනි.

06 ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ

ධුනාථ මච්චුනෝ සේනං - නළාගාරංව කුඤ්ජරෝ

මෙම ගාථාව ඇතුළත් වන්නේ,

(1) සිඟාලෝවාද සූත්‍රයේය. (2) මංගල සූත්‍රයේය.

(3) කරණීයමෙත්ත සූත්‍රයේය. (4) අරුණවතී සූත්‍රයේය.

07 බෞද්ධයෝ උපතේ සිට මරණය දක්වා සියලු සුවිශේෂ අවස්ථාවලදී සංඝරත්නයේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරති. භික්ෂූන් වහන්සේලා ගැබිණි මාතාවන්ට ආශිර්වාද සඳහා දේශනා කරනු ලබන සූත්‍ර දේශනාව වන්නේ,

(1) රතන සූත්‍රයයි. (2) අංගුලිමාල පිරිතයි.

(3) කරණීයමෙත්ත සූත්‍රයයි. (4) ධජග්ග සූත්‍රයයි.

08 අවමංගල අවස්ථාවන්හිදී මහා සංඝරත්නය විසින් ආගමික වතාවත් සිදුකිරීමේ දී දුකට පත් ඥාතීන්ට ත්‍රිලක්ෂණයේ ස්වභාවයන් පැහැදිලි කරමින් සාරගර්භ අනුශාසනා පවත්වති. ත්‍රිලක්ෂණය යනු,

(1) දාන, සීල, භාවනායි. (2) සීල, සමාධි, පඤ්ඤායි.

(3) අනිත්‍ය, දුක්ඛ, අනාත්මයි. (4) ලෝභ, ද්වේශ, මෝහයි.

09 පිංකම් මගින් බෞද්ධයා බලාපොරොත්තු විය යුත්තේ අකුසල් මුල් ක්‍රමයෙන් තුනී කර ගැනීමයි. එසේ තුනී කරගත යුතු අකුසල් මුල් වන්නේ,

(1) අලෝභ, අදෝස, අමෝහයි. (2) ලෝභ, දෝස, මෝහයි.

(3) රාග, දෝස, මෝහයි. (4) කාමාසම, භවාසම, අවිජ්ජාසමයි.

10 මිනිසා මිත්‍යාවෙන් මුදවා සත්‍ය කරා යොමුකිරීමේ සමාජ නායකත්වය පැවරී තිබෙන්නේ,

(1) පොලීසියටයි. (2) ග්‍රාම නිලධාරියාටයි.

(3) සමථ මණ්ඩලයටයි. (4) මහා සංඝරත්නයටයි.

11 භික්‍ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගෙන් ප්‍රත්‍ය පහසුකම් ලබාගත යුත්තේ,

(1) බමරා මල නොතලා රොන් ගන්නාසේය.

(2) මිනිසුන්ට බණ කියාය.

(3) මිනිසුන්ගෙන් බලහත්කාරයෙනි.

(4) මිනිසුන් කැමැති නම් පමණකි.

12 බුද්ධරත්නයේ ගුණ සිහිකරන ගාථා පාඨය වන්නේ,

(1) ''නමාමි බුද්ධං'' යන පාඨයයි.

(2) ''ස්වාක්ඛාතෝ භගවතා'' යන පාඨයයි.

(3) ''සුපටිපන්නෝ භගවතෝ'' යන පාඨයයි.

(4) ''ඉතිපිසෝ භගවා'' යන පාඨයයි.

13 සියලු කෙලෙසුන්ගෙන් දුරුවූ හෙයින් ද, රහසින්වත් පවු නොකළ හෙයින් ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින්ද බුදුන්වහන්සේ

(1) ''බුද්ධ'' නම් වන සේක. (2) ''භගවා'' නම් වන සේක.

(3) ''අරහං'' නම් වන සේක. (4) ''සම්මා සම්බුද්ධ'' නම් වන සේක.

14 ධර්මරත්නයේ ගුණ කියවෙන පාඨයේ අඩංගු ගුණ ගණන,

(1) පහකි. (2) හයකි. (3) අටකි. (4) නමයකි.

15 මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා

(1) ආහුණෙය්‍ය ගුණයෙන් යුක්ත වේ. (2) දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත වේ.

(3) සුපටිපන්න ගුණයෙන් යුක්ත වේ. (4) අංජලිකරණීය ගුණයෙන් යුක්ත වේ.

16 අවබෝධයෙන් යුතුව දෛනිකව තෙරුවන වන්දනයෙහි යෙදීමෙන් ශ්‍රද්ධාව තව තවත් වර්ධනය වන අතර ජීවිතය සාර්ථක වේ. තෙරුවන් ගුණ ආදර්ශයට ගෙන ක්‍රියා කළහොත් සැබැවින්ම අපට බෝසත් දරුවන් විය හැකිය. තෙරුවනෙහි ගුණ ගණන,

(1) සූවිස්සකි. (2) විස්සකි. (3) සත් විස්සකි. (4) පස් විස්සකි.

17 තෙරුවන් සරණ යා යුත්තේ,

(1) බිය නිසාය. (2) දෙමාපියන් කියන නිසාය.

(3) අවබෝධයෙනි. (4) ලාභ ලැබීමේ ප්‍රයෝජනයෙනි.

18 ජලය රත්වී උතුරනවිට බුබුළු නැගෙන ජලයෙහි යමක් දැකිය නොහැකිය. එසේම තරහව ඇතිවිටද යමක් මතකයට නගා ගත නොහැකිය. මෙම අවස්ථාව

(1) කාමච්ඡන්දය සිතෙහි ක්‍රියාත්මක වන අවස්ථාවයි.

(2) ව්‍යාපාදය සිතෙහි ක්‍රියාත්මක වන අවස්ථාවයි.

(3) ථීනමිද්ධය සිතෙහි ක්‍රියාත්මක වන අවස්ථාවයි.

(4) විචිකිච්ඡාව සිතෙහි ක්‍රියාත්මක වන අවස්ථාවයි.

19 හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියාවන්හිදී අවබෝධයෙන් යුතුවීම

(1) ඉන්ද්‍රිය සංවරයයි. (2) කාය සංවරයයි.

(3) මානසික සංවරයයි. (4) සති සම්පජඤ්ඤයයි.

20 සමථ භාවනාව වඩන පුද්ගලයාට ආචාර්යවරයකුගෙන් උපදෙස් ලබාගැනීම ද අවශ්‍ය වේ. එහිදී තමාගේ චරිතයට අනුව කර්මස්ථානයක් තෝරාගත යුතුය. ඒ සඳහා තෝරාගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන,

(1) තිහකි. (2) හතලිහකි. (3) හතලිස් පහකි. (4) පනහකි.

21 භාවනාවට පිවිසෙන තැනැත්තා පූර්ව අවශ්‍යතා ඉටුකරගත යුතුය. ඒවාට අදාළ නොවන්නේ,

(1) සිල්වත් වීම (2) ධර්ම ශ්‍රවණය කිරීම

(3) ධර්ම දේශනා කිරීම (4) ප්‍රඥාවෙන් යුක්ත වීම

22 සිදුහත් බෝසතාණෝ ''කිං කුසල ගවේසී''ව සිටි කාලයේ දී හමුවූ සප්ත සමාපත්ති ලාභී තාපසයා

(1) ආලාර කාලාම තවුසායි. (2) උද්දකරාම තවුසායි.

(3) අසිත තවුසායි. (4) කොණ්ඩඤ්ඤ තවුසායි.

23 පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූත, ඇස හා රූප, කන හා ශබ්ද, නාසය හා ගඳ සුවඳ, දිව හා රස, සිරුර හා ස්පර්ශය යන සාධකවල එකතුව

(1) සඤ්ඤාස්කන්ධයයි. (2) වේදනා ස්කන්ධයයි.

(3) සංඛාරාස්කන්ධයයි. (4) රූපස්කන්ධයයි.

24 ධර්ම විනය පිළිබඳ විශාරදයකු වූ වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකි. එයට අදාළ නොවන්නේ,

(1) මුනිගුණාලංකාරය (2) සාරාර්ථ සංග්‍රහය

(3) බුදුගුණාලංකාරය (4) සතර බණවර සන්නය

25 ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය.'' මෙම අභීත ප්‍රකාශය කළේ,

(1) පණ්ඩුකාභය රජතුමාය (2) දෙවන පෑතිස් රජතුමාය

(3) වළගම්බා රජතුමාය (4) දුටුගැමුණු මහ රජතුමාය

26 දමනය වීම, සංයත බව, හික්මීම, සීලයෙන් කය වචනය හික්මවීම, සමාධියෙන් සිත හික්මවීම, එම ගුණ ධර්මයෙහි පිහිටා කටයුතු කිරීම

(1) සතිමත්වීමයි. (2) සඤ්ඤත ගුණයයි.

(3) නිසම්මකාරී ගුණයයි. (4) ධම්මජීවී ගුණයයි.

27 සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතුවන කරුණු ගණන

(1) දෙකකි. (2) තුනකි. (3) හයකි. (4) දහයකි.

28 සෑම කටයුත්තකම දක්ෂ වීම හා අනලස් වීම

(1) සැමියාගේ යුතුකමකි. (2) බිරිඳගේ යුතුකමකි.

(3) සේවකයන්ගේ යුතුකමකි. (4) දරුවන්ගේ යුතුකමකි.

29 ''ඔබවහන්සේ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් ද?'' බුදුන්වහන්සේගෙන් මෙසේ විමසා සිටියේ,

(1) ද්‍රෝණ බමුණාය (2) මාගන්දි බමුණාය

(3) වච්ඡගොත්ත බමුණාය (4) සංජය පිරිවැජියාය

30 පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා පිළිබඳව සඳහන්වන ප්‍රධානතම සූත්‍ර දේශනාව වන්නේ

(1) පරාභව සූත්‍රයයි. (2) වේළුද්වාර සූත්‍රයයි.

(3) සිඟාලෝවාද සූත්‍රයයි. (4) මංගල සූත්‍රයයි.

31 පද්මාකාර විරාගික ආකල්ප අපගේ ජීවිතයට එකතු කරගන්නා ප්‍රමාණයට

(1) ලෝකයාගෙන් ඈත්විය හැකිය.

(2) දුක් අඩුකර සැප ළඟාකර ගත හැකිය.

(3) සැප පමණක් විඳිය හැකිය.

(4) දුක හා සැප දරාගත හැකිය.

32 බුදු දහම අනුව මිනිසුන්ගේ සචේතනික ක්‍රියාවන් ප්‍රකටවන දොරටු ගණන

(1) තුනකි. (2) පහකි. (3) හතකි. (4) නවයකි.

33 සුභ මානවකයාට එදා බුදුන්වහන්සේ වදාළ පරිදි අකුසල කර්ම හෙවත් සසර දුක් උපදන නරක අවැඩදායක සචේතනික ක්‍රියා දස අකුශල කර්ම නමින් හැඳින්වේ. වචනයෙන් කෙරෙන වැරදිවලට අදාළ නොවන්නේ,

(1) බොරු කීම (2) කේලාම් කීම (3) හිස් වචන කීම (4) ප්‍රිය වචන කීම

34 පර පණ නැසීමේ අකුශල කර්මය බුදු දහමේ උගන්වනු ලබන්නේ,

(1) කායික අකුශල කර්ම ලෙසයි.

(2) වාචසික අකුශල කර්ම ලෙසයි.

(3) මානසික අකුශල කර්ම ලෙසයි.

(4) කායික හා මානසික අකුශල කර්ම ලෙසයි.

35 මරණින් මතු පළමු ආත්ම භවයේ දී විපාක දෙන කර්මය

(1) දිට්ඨධම්මවේදනීය කර්මයයි. (2) උපපජ්ජවේදනීය කර්මයයි.

(3) අපරාපරියවේදනීය කර්මයයි. (4) අහෝසි කර්මයයි.

36 ''කටත්තා කර්ම'' යනු

(1) වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි කර්මයි.

(2) මරණාසන්න අවස්ථාවේ දී කරන ලද කර්මයි.

(3) ජීවිත පුරුද්දක් ලෙස සිදුකරන ලද කර්මයි.

(4) දැඩි චේදනාවක් නොමැතිව සිදුවන අසම්පූර්ණ කර්මයි.

37 අකුශල චේතනා පමණක් ඇතුළත් නොවන වරණය වන්නේ,

(1) ලෝභ, අදෝස, මෝහ (2) ලෝභ, දෝස, මෝහ

(3) මෝහ, ලෝභ, දෝස (4) දෝස, ලෝභ, මෝහ

38 බුදුවරුන් උපන්නද, නූපන්නද සදාකාලිකව ලොව පවත්නා සත්‍යය වන්නේ,

(1) ත්‍රිවිධ ශික්ෂාවයි. (2) ත්‍රිලක්ෂණයයි.

(3) ත්‍රිවිධ පුණ්‍යක්‍රියායි. (4) ත්‍රිවිධ ඥාණයයි.

39 ''අනිච්චාවත සංඛාරා - උප්පාදවයධම්මිනෝ'' යන ගාථාව අඩංගු සූත්‍රය

(1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) වේළුද්වාර සූත්‍රයයි.

(3) පරාභව සූත්‍රයයි. (4) පරිනිබ්බාන සූත්‍රයයි.

40 සියල්ලෙහි පවත්නා වෙනස්වන ස්වභාවය

(1) දුක්ඛ ලක්ෂණයයි. (2) අනාත්ම ලක්ෂණයයි.

(3) අනිත්‍ය ලක්ෂණයයි. (4) ආත්ම ලක්ෂණයයි.

ih, u yuku wejrK
*All Rights Reserved*

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

**10 ශ්‍රේණිය**

# බුද්ධ ධර්මය - II

**කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ. ((1) - ලකුණු 02 (2) - ලකුණු 03 (3) - ලකුණු 05 වශයෙනි.)

01 (1) යසෝදරා දේවිය පුතකු ලද බව ඇසූ විගස පැවිදිවීමට බාධාවක් ඇතිවූ බව සිහිවී සිදුහත් කුමරුගේ මුවින් නික්මුණ වදන කුමක් ද?

(2) සතර පෙර නිමිති දැකීමෙන් සිදුහත් කුමරුට අවබෝධ වූයේ කුමක් ද?

(3) ''මෙවැනි පුතකු ලද මවක්, පියෙක් නිවුණෝ වෙති. මෙවැනි ස්වාමියෙක් ඇති බිරිඳ නිවීම ලැබ සිටින්නියකි.'' මෙම ප්‍රකාශය කළේ කවුද?

(4) කුසල චේතනා තුන කුමක් ද?

(5) යමක් අනිත්‍ය, දුක්ඛ ලක්ෂණයෙන් යුක්ත නම් ඒවා ............ ලක්ෂණයෙන් යුක්ත වේ.

(6) සිත, කය, වචනය යන තුන් දොරින් ප්‍රාණඝාත අකුශලය සිදුවන දොරටුව කුමක් ද?

(7) දැනට ලොව පවතින පැරණිම පැවිදි සංවිධානය කුමක් ද?

(8) සංඝරත්නයේ ගුණ ගණන කීයද?

(9) ප්‍රඥා භාවනාව ලෙස හැඳින්වෙන භාවනාව කුමක් ද?

(10) මිරිස් ව්‍යඤ්ජනයක් සඟරුවනට පූජා නොකොට ආහාරයට ගැනීම ගැන තමාටම දඬුවම් දෙනු පිණිස දුටුගැමුණු රජතුමා ඉදිකළ දාගැබ කුමක් ද?

02 (1) ත්‍රිලක්ෂණය පිළිවෙලින් ලියන්න.

(2) එම අංග තුන කෙටියෙන් පහදන්න.

(3) ත්‍රිලක්ෂණය පිළිබඳ දැනීම නිසා අපට ජීවිතයේ අමිහිරි අවස්ථාවලට මුහුණ දීමේ ශක්තිය ගොඩනැගෙන අයුරු පෙන්වා දෙන්න.

03 (1) සමථ භාවනාව යන්නෙහි අරුත ගෙනහැර දක්වන්න.

(2) සමථ භාවනාව වඩන අයකු සතු ගුණාංග තුන තේරුම් සහිතව සඳහන් කරන්න.

(3) පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට භාවනාවෙහි ඇති ප්‍රයෝජන විස්තර කරන්න.

04 (1) බුදුන්වහන්සේ කර්මය හඳුන්වා ඇත්තේ කෙසේදැයි දක්වන්න.

(2) කර්මය තුන් ආකාරවන අයුරු දක්වන්න.

(3) කයින්, වචනයෙන්, සිතින් සිදුවන දස අකුසල් වෙන වෙනම වර්ග කර දක්වා අපට අකුසල්වලින් වැළකී කුසල් කළ හැකි බව පෙන්වා දෙන්න.

05 (1) සිඟාලෝවාද සූත්‍රයට අනුව සමාජය සය ආකාර වේ. ඉන් දෙකක් සඳහන් කරන්න.

(2) ස්වාමියා විසින් තම සේවකයාට ඉටුකළයුතු යුතුකම් තුනක් ලියන්න.

(3) වර්තමානයේ රැකියා ආයතනවල ඇතිවන ගැටුම් අවම කර ගැනීමට ස්වාමි සේවක අන්‍යෝන්‍ය යුතුකම් උපයෝගී කරගත හැකි අයුරු පහදන්න.

06 (1) බහු ජාතික, බහු ආගමික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.

(2) එහිදී අත්තූපනායික ධර්ම වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

(3) සිවු බඹ විහරණ ජාතික ආගමික වෙනස්කම්වලින් තොරය. පැහැදිලි කරන්න.

07 (1) බුදු දහමෙහි සීලය උගන්වා ඇත්තේ කෙසේද?

(2) සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස තුනක් දක්වන්න.

(3) ''සිල්වත් වීම ධනෝපායනයට උපකාරයකි.'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.